# පන්හිඳයි පින්සලයි

-අවුරුද්දක් ! '' අළුත් අවුරුද්දක් මෙන්න ඇවිල්ලා !" පන්හිඳ තාලයට කිව්වේ පොරවන රෙද්ද නවලා තියන ගමන්.
''අවුරුද්දක් ! '' තවත් අවුරුද්දක් ගෙවිලා ගිහිල්ලා !"
පින්සලත් තාලයට උත්තර දුන්නා.
ඒ නාන කාමරයේ මූණ හෝදන ගමන්. කොහොමත් නාන කාමරයේ සෑහෙන වෙලාවක් ගත කරනවා. ඒ කටයුතු කෙරෙන අතරේ ''ටොයිලට් එෆ්. එම්." උදා විකාශයකුත් හැමදාම වගේ කෙරෙනවා. කවි, සින්දු, බයිලා.. මේ හැම එකක් ම පාහේ ඒ '' ඒ දවසේ ''මූඩ්" එකට ගැලපෙන්න ප්‍රචාරය කරන්න පින් හරි දස්සයා.

## ඇපල් මාළුව

''කොහොම ද ප්‍රේමා අක්කාගේ ඇපල් මාළුව ? " පින් සාලුවෙන් මූණ පිහින ගමන් එළියට ආවෙ කලින් දා කෑව ඇපල් ව්‍යංජනය ගැන සිහියෙන්. ප්‍රේමා අක්කාය කියලා කිව්වේ ඩැංඩිනොංවල ප්‍රේමා කටුගම්පල සොහොන යට ''ඉදං උදේට ඉඳි ආප්ප කන්නත් තියාගත්තා ටිකක් !" පන් කිව්වා. ''මට මතක් වුණේ ගමේදි නන්දා අක්කා හදලා දුන්නු ඇම්බරැල්ලා මාළුව !"
''ඇයි කඩුවෙල විතානගේ අයියගේ අක්කා හදපු අඹ මාළුව ? ඒක මතක් වෙලා තමයි ඉඳි ආප්ප කන්න ඇපල් මාළුවෙන් ටිකක් තියාගත්තෙත් !"
පන්ටත් පින්ටත් ලංකාවෙදි කාපු බීපු ඒවා මතක් වෙලා. ''ඉඳි ආප්ප වලට අඹ මාළුව වගේම ඇපල් මාළුවත් මරුවට හිටිවි !"

''අපේ අය එහේ කරපු කියපු දේවල් මේ රටෙත් ගෙනැත් තියෙන හැටිනේ පුදුමේ. මෙහේ තියෙන හොඳ දේවල් එක්ක මුහු කරලා තමන්ට ගැලපෙන දෙයක් අලුතින් හදා ගන්න අපූරුව ? නන්දා අක්කලා විතානගේ අක්කලා එහේ කරපු දේ තමයි ප්‍රේමා අක්කලා මෙහේ දේවල්වලින් කරන්නෙ.

''පෝය '' පෝය ගැන්න
රටේ
උන්නු අපේ මුතුන්මිත්තන්
දුන්නු අපේ හොඳ දේවල්
අපිත් ගෙනාවා !
මාස '' මාස ගනින රටට
අපිත් ගෙනාවා !

පන් අළුත් ම තාලයකට ඇදලා '' පැදලා කිව්වා.
''ඒ අතින් බැලුවම අපේ දේවල් කොච්චරනං කියලා ගෙනත් තියෙනවද ? කවි '' සින්දු, පොත් '' පත්, නැටුම්, චිත්‍ර, කැටයම්, භාෂාව, මාධ්‍ය, නාට්‍යය, ටෙලිනාට්‍ය, සිනමාව,...."

''සන්නස සාහිත්‍ය උත්සවය දවසේ වික්ටෝරියානු පාර්ලිමේනතුවේ යුරෝක් ඡන්ද කොට්ඨාශයේ ලිස් බීට් මන්ත්‍රී තුමිය කියපු දේ මතකද ?"



**සිසිර දිසානායක**

''ඔයාලගෙ රටවල්වලින් ඔයාලා ගෙනැත් තියෙන ඔයාලගේ සංස්කෘතික දේවල් මේ රටේ පතුරවන්න. ඒ සංස්කෘතික අංග අපේ රටට ගොඩක් වටින සම්පත්. ඒ දේවල් නො මසුරුව අපිට දායා කරන්න....යි කියලා කිව්වේ නිකං නෙවි. ''සන්නස" පත්තරය හරහා ඒ කරන සද්කාර්යයට නේ ජගත් එදිරිසිංහ සොයුරාට තිළියකුත් පිරිනැමුණෙ".

''අපේ රටේ හොඳ දේවල් වගේම මේ රටේත් තියෙනවා හරියටවත් හොඳ දේවල් ඉගෙනගන්න. ඇත්තටම ඉතින් මැරෙනකල්ම වුණත් ඉගෙනගන්න දේ නං අනන්තයි, අප්‍රමාණයි. සමහර හොඳ දේට අපිට හුරු වෙන්න අමාරු වෙන්න පුළුවන්. ඒත් අපේ ඊළඟ පරම්පරාවටත් එහේ වගේම මෙහේ හොඳ දේවල් ඉගෙන ගෙන ඉස්සරහට යනවනං හොඳා" පින් කිව්වා.

''මෙහේ හොඳත් අරන් හිතට
ලොවට වැඩක් වෙන්න හොඳට
ඉගෙන ගන්නවා......" පන් තවත්
තාලයකට කිව්වා." මන්ත්‍රීවරියගේ කතාව ඇත්ත. මෙහේ ආදි වාසී අයගේ දේවල් මේ අය කොයි තරම් අගය කරනවද ? අපේ රටේ එහෙම කරන්නේ කීයෙන් කීදෙනෙක් ද ? ඒ වගේ ම අනික් රටවල්වලින් එන හොඳ දේත් ගන්න උත්සහ

කරනවා. ''ඩාන්සින් විත් ද ස්ටාර්ස්" තරඟයේ කට්ටියම එකතු වෙලා නටපු ''බොලිවුඩ්" නැටුම් මතකනෙ ?"

''ඔය කියන කොටයි මතක් වුනේ ! ''සිරස වසන්නතයේ" ප්‍රසංග වේදිකාවේ සුදු ජාතික ගැටව් ගැටිස්සියන් නටපු අපේ සිංහල නැටුම.
ඇත්තට ම රංග '' උදුම්බරා දෙන්නා හරිම අගේට ඒ සුදු ජාතික ළමයි පුරුදු පුහුණු කරලා තිබුණා. මටනං මතක් වෙනකොටත් කඳුළු උනනවා.... ඇස්වහක් කටවහක් නෑ..." පින් පොඩ්ඩක් හැඟීම්බර වෙලා. රසිකා කුලසිංහ ගුරුතුමිය වුණත් ගන්න




උත්සාහය අපූරුයි.

''ඇයි මතක නැද්ද අර ''කෙයා ගො කැන්සර් චිල්ඩ්‍රන් සංවිධානයෙන් ලංකාවේ පිළිකා වැළඳුන ළමයින්ට පිහිට වෙන්න හිතාගෙන ඒ වෙනුවෙන් ම කරපු ගීතය. අපේ ළමයි එක්ක සුදු ජාතික ළමයි හරි හරියට ඉංග්‍රීසියෙන් වගේම සිංහලෙනුත් ගායනාව ඉදිරිපත් කළේ අපූරු හැඟීම්බර රංගනයකුයි නැටුමකුයි එක්ක. ජේත දේවපුර සංවිධානය කරපු ඒ වැඩේ සම්බන්ධීකරණය කරලා අගේට පුහුණු කළේ චිත්‍රනී ඒකනායක දැරිවිනෙ. ඇයි ජාතික දිනයට කරපු සිංදුව ? මාලනී ජයසිංහ අක්කලායි ඒ වැඩේ කළේ "

පොත පත ගත්තත් එහෙම තමයි. අපේ අය මෙහේ අත්දැකීම් ලංකාවේ දේවල් එක්ක අගේට ගලපලා ලියනවා. පාලිත ගනේවත්ත උන්නැහෙ ''ඇවිත් නොරටක" පොතෙන් කියන්නේ එහේ ඉඳන් මෙහේ ආව අය බොහෝ දෙනෙකුට අත් විඳින්න වෙන සංතෑසිය. අපේ අය මේ රටට ළමයි අරගෙන එන්නේ ළමයින්ට උගන්නන්න. ඒත් ඒ අය ගැන විමසිල්ලෙන් නූන්නොත් මොකද වෙන්නේ ? ඒ අපේ හොඳ දේටත් හුරු කළා නම් ?"

''හැබැයි ජගත් එදිරිසිංහ ලොක්කගෙ ''අසුර අඩවිය" පොතෙන් කියවෙන්නෙ වෙනමම පැත්තක්. අනියම් ආකාරයට මෙහාට සේනදු වෙච්ච අයගෙ කතාව."
''ඔය කියන කොටයි මතක් වුනේ ! මේ රටට ආව අළුත මේ රටේ තනිවුණ කෙනෙකුට ඇතිවන හැඟීම් ගැන අගේට ලියවුණ ගීතයක්නෙ ජගත්ගේ ''නුවර වාහල්කඩ" සිනදුව. ඒකට ''හිප්''හොප්" සංගීතය මුල් කරගෙන අමුතුම සංගීතයක් මැව්වෙ අමල් ලක්බිත ගුණතිලක. චිත්‍රනී වගේම අමල් ලක්බිතත් මේ රටට සංක්‍රමණය වෙලා ඉන්න අපේ දෙවෙනි පරම්පරාවෙ ළමයි. අපි හැමදාම කතා කරන දිලිනි ප්‍රනාන්දු, වීණා කෑඳරගම, නවීන් ගුලවිට අසුන්තා කරුණාරත්න වගේ අය මේ රටේ විදියට වාදනය කරන්න ගායනය කරන්න ඉගෙන ගෙන අපේ රටේ අයගෙ ප්‍රසංගවල හපන්කම් පෙන්නන්න දෙවෙනි පරම්පරාවෙ ළමයි. කාටද ආඩම්බර ? මේ අයට මග පෙන්නන්නෙ කැමරන් කොළඹගේ, විජිත අමරසේකර, රොහාන් නෙත්තසිරි වගේ අය ගැනත් මතක් කරන්න ඕන.

''ලලිත් අරුණශාන්තගේ ඔය කිව්ව සින්දුව වගේ ම ''පානාති පාතා පදයෙන් " සින්දුවත් එහේ '' මෙහේ දේවල් යා කරගෙන චන්ද්‍රසේන රංගේ ගී පද රචක මහත්තයා ලියපු එකක්'' පන් මතක් කළා. ''මෙල්බර්න් ගැනමනෙ කියවෙන්නෙ''

''අපේ මුතුන් මිත්තෝ ඒ කාලේ කාලය ගැන්නෙ පෝයෙන් පෝයට.. දුරුතු පෝය නවම් පෝය.. අවුරුද්ද පටන් ගත්තෙ බක් මාසයේ.. එහෙමත් නැත්නම් අප්‍රේල් මාසයේ.. ඒකට රාශී චක්කරේකුත් මුල් වුණා.. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට මාරු වෙන කොටයි පරණ අවුරුද්ද ගෙවිලා අලුත් අවුරුද්ද ලබනවාය කියලා කියන්නේ.. ක්‍රිස්තු වර්ෂ ක්‍රමයත් එක්ක ඉිගිරිසි පන්නෙට මාස ගණින රටකයි අපි දැන් ඉන්නෙ..''

''පෝය ගැන්න වුණත් මාස ගැන්න වුණත් අවුරුද්ද පිරෙන්නෙ දවස් වලින්.' පන් කිව්වෙ මහා තර්ක ශාස්ත්‍රඥයෙක් වගේ.

''උදේට ඉර නැගලා හවහට බැහැලා ගියාම සවසක් ගෙවුණා කියලයි ඔය හැමෝම කියන්නෙ.. අපි මොන රටේ විදියට හිතුවත් අන්තිමේට හිත්නනෙ එකම දෙයක් ගැන.. 'ආයුබෝවන්' කියලා මුලු ජීවිත කාලයටම වුණත් ගැලපෙන්න පතන පැතුම මේ අය 'ශුභ උදෑසනක්' 'ශුභ සැන්දෑවක් ශුභ රාත්‍රියක්' 'ශුභ දිනයක්' කියලා පතනවා. දෙගොල්ලොම ශුභ අලුත් අවුරුද්දක් කියලා පතනවා. ඒත් අවුරුද්ද පිරෙන්නෙ අපි හැමෝම එක විදියට කල්පනා කරන දවස් වලින්. ඒ හන්දා හැම දවසක් ම 'හොඳ දවසක් වෙන්න' කියලා පතමු.

''පෝය පෝය ගැන්නා වුණත්
මාස මාස ගැන්නා වුණත්
දවස් වලින් අවුරුද්දේ වයස පිරෙනවා
හැම දවසම හොඳ දවසක් වෙන්න පතනවා''

''එතකොට ඉබේටම අවුරුද්දම හොඳ අවුරුද්දක් වෙන්න කියලා ප්‍රාර්ථනා වෙනවනෙ'' පන් තව පද කීපයක් පිරුවා.
''මේක හොඳයි අපේ සංඛ පද්ම සංගීත පන්තියෙ ළමයි ලවා කියවන්න.'' පද ටික දැකපු වාසනා වීරකෝන් ගුරුතුමිය අපූරු තාලයක් පද ටිකට කැව්වා. කැමරන් කොළඹගේ සහෝදරයා සංගීත කොටස් එකතු කරලා තනුව හැඩ කළා. නාලක වීරකෝන් රෝහිත උඩවෙල වගේ අය වාදනයෙන් කැමරන්ට උදව් වුණා.

'' අපි මේකට හොඳ නැටුමකුත් එකතු කරලා නිමල් අල්විස් ට දෙමු එයාගේ 'ශ්‍රී ලංකන් මෝර්නිං ෂෝ' එකට. රත්නා ගුරුසිංහ අමා සිරිවර්ධන නර්ථන ආචාර්යවරියට ඒ වැඩේ පංගනාත කළා. සාමූහික ප්‍රයත්නයක්. බලමු මොකද වෙන්නෙ කියලා.

'' ලබන අලුත් අවුරුද්දම කිරි පැණියෙන් ඉතිරෙන්නට පැතුම් පතනවා..'' පන් සන්නස වෙනුවෙන් පාඨකයින්ට සුභ පතන ගමන්ම සින්දුවේ අන්තිම පදයත් සම්පූර්ණ කළා.

ගොඩවන්න
www.ketapathpawra.com
www.sannasa.net
www.thisara.com

GATEWAY LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila